# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | SASA/2022/A/34 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.05.10 |

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**<u>ස්ථාවර රජයක් පිහිටුවා ජන ජීවිතය යථාවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම</u>**

මේ වන විට රට අරාජික තත්ත්වයට පත්ව ඇති අතර පවතින ආර්ථික අර්බුදය තවදුරටත් උග්‍ර වී රට බංකොලොත් තත්ත්වයට පත්වීමේ අවදානමකට මුහුණ දී ඇත. මේ තත්ත්වය යටතේ මහජනතාව මෙන්ම රාජ්‍ය නිලධාරීන් ද දැඩි අපහසුතාවයට පත්ව තිබේ.

දැනට උද්ගතව ඇති ප්‍රබල ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය සේවය නිසි පරිදි පවත්වා ගෙන යමින් ඉදිරි අත්‍යවශ්‍ය වියදම් සඳහා අනුමැතීන් ලබා ගැනීමටත් , අමතර ප්‍රතිපාදන ලබා ගැනීමටත්, රාජ්‍ය ණය සීමාව වැඩි කරගත යුතුව ඇත.

තව ද, අත්‍යවශ්‍ය ඖෂධ හිඟය, ආහාර හිඟය හා බලශක්ති අර්බුදය වැනි කරුණු මහජන කැළඹීම් තවදුරටත් වර්ධනය වීම කෙරෙහි බලපෑ හැකි බැවින් මහජනතාව පිළිගන්නා අන්තර්වාර පාලනයක් ඇති කොට පළමුව පරිපූරක අයවැයක් අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතු බවත්, එය ප්‍රමාද කිරීම මහජන සාමය හා යහපැවැත්ම බිඳ දමන ප්‍රචණ්ඩකාරී ක්‍රියා කෙරෙහි හේතු විය හැකි බවත් අප සංගමයේ ස්ථාවරයයි. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපය තවදුරටත් බිඳ වැටීම වළක්වා ගැනීම සඳහා මෙසේ රට ස්ථාවර කිරීම සඳහා වහා පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව, කඩිනමින් පාර්ලිමේන්තුව කැඳවා ස්ථාවර රජයක් පිහිටුවීමටත්, පරිපූරක අයවැයක් සම්මත කොට අත්‍යවශ්‍ය රාජ්‍ය වියදම් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මැදිහත් වන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

**පදුල ශ්‍රී රෝහණ ද සිල්වා**
ගරු සභාපති

**ප්‍රදීප් ලක්ශාන්ත**
ගරු ලේකම්


23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05. 23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.
23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.
දුරකතනය/ தொலைபேசி/Telephone : 011 5766855 ෆැක්ස්/தொலைநகல்/ Fax : 011 2058027
විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ Email : sasa.execo@gmail.com වෙබ් අඩවිය/இணையத்தளம்/ Web: www.sasa.lk